ශ්‍රී සංස්කෘතික සාහිත්‍යය

"පස් පල වතින් යුත් බුලත් කා"

"තාම්බුල වල්ලි තාම්බුලි " භූලතා නාග වල්ලරි
එණි වල්ලි ජර්ණාලතා " භක්ෂ්‍ය පත්‍රිව නාගිනී"
"සාරාර්ථ සංග්‍රහය"

තාම්බූල, භූලතා, නාගවල්ලි, නාගවල්ලරි, ජෙණවැල්, ජර්ණාලතා, භක්ෂපත්‍ර ආදී නම්වලින් හැඳින්වෙන බුලත් කොළය සිංහල සංස්කෘතියේ විශේෂ තැනක් ගනී. සිංහල, දෙමළ ජනතාව එදිනෙදා ජීවිතයේදී බුලත් සැපීම පුරුද්දක් වශයෙන් කරගෙන එති, පකිස්ථානය වැනි පෙරදිග වෙනත් රටවලද බුලත් භාවිත කෙරේ. බුලත් වගාව

ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ද යම් බලපෑමක් කරයි. බුලත් අපනයනය ද සුළු වශයෙන් සිදු කෙරේ. බුලත් වගාව හා අලෙවිය එක්තරා පිරිසකගේ ජීවනෝපායද වී ඇත. ලංකාවේ ගම්පහ ආශ්‍රිත ප්‍රදේශයේ බුලත් වගාව සරු ලෙස සිදු කෙරේ.

බුලත්ගම, බුලත්කොහුපිටිය වැනි ග්‍රාමයන් බුලත් හා බැඳී ඇත. ගස් බුලත්, කොටුබුලත් යනුවෙන් බුලත් වර්ග දෙකකි. ගස් බුලත, කොටු බුලතට වඩා සැරය. සිවුකෝරළය, මහනුවර වැනි උසටට පළාත් වල ගස්බුලත් වැඩි වශයෙන් භාවිතා වේ.

ජේම්ස් ද අල්විස් මහතා බුලතෙහි ගුණ තෙළෙසක් මෙසේ සිලෝවකට බැඳ දක්වයි.

"බුලත් මිහිරි තිත් වේ කාර කාසා කුළුත් වේ
පණු දුගඳ දොසුත් වා සෙම් නාසා වත් සරාලයි
මිළහැර මත යෝනා ගින්න දල්වයි බුලත් හී
ගුණ තෙළෙසක් මින් වේ දෙව්ලොවේ වත් සුදල් බෝ"

බුලතේ උපත දළුමුර කාව්‍යයේ මෙසේ ප්‍රකාශ වේ.
සක්දෙපුරද සඳමඩල මැද සස රුව ඇඳ තෙලි කූර පොළවට විසිකළේය. නා ලොවට වැටුණු තෙලිකූර මුවලින්ද නා රජු ගිල්ලේය. එයින් ඔහුගේ ගිරිය දා ගියේය. දීන හතකින් මියගිය නා රජුගේ දේහය දැවූ තැන පැලයක් නැගුණි. අතික නාගයෝ එය මුරකළහ. මියගිය මුවලින්දගේ වැලිගයෙන් බුලත්පකන්දු සිරුරෙන් බුලත් වැලඳ පෙණයෙන් කොළද හට ගති. එනිස නාගවල්ලි නම් විය. ගිරිය දාගිය බැවින් ගිරිදා විය. නයින් විසින් මුරකළ බැවින් දළුමුර විය. මේ අනුව බුලත් ගෙනාවේ නා ලොවින් යයි විශ්වාසයක් පවතී. උමා දේවිය රෝපනය කළ බුලත් වැලෙන් මෙලොවට බුලත් පහළ වූ බව ගැමි විශ්වාසයයි.

"හැරගිය මලකඳ දවා පුළුස්සති
පෙරදැමූ තෙලෙන් දළුව පිටත්වෙති
මුරකාවල් නයි වට මුර සිටිති
මුර සිටියට දළුමුර නම පවතී"

උමා දේවිය රෝපනය කළ බුලත් හුලත් බැවින් බුලත් වූ බවද අසන්නට ඇත. කෙසේ වෙතත් බුලතත් නා ලොවත් අතර ඇති සබඳතාව විමසිය යුත්තකි. බුලත සැපීමට පෙර එහි අග මුල කඩා දැමීම සිරිතකි. ගයා බුලත් කටින් රැගෙන එනවිට එහි කෙළවර විෂ ගෑවි ඇති බැවින් එසේ කරන බව ගැමි විශ්වාසයයි.

මනාලයකු මනාලිය කැඳවාගෙන ඒම සඳහා නිවසින් පිටත්වන අවස්ථාවේදී දෙමාපියන්ටත් වැඩිහිටි අයටත් බුලත් පිළිගන්වා වැඳ ආශිර්වාද ලබාගැනීම සිරිතයි. මංගල ආරාධනා කරන්නේත් බුලත් පිළි ගැන්වීමෙනි. මගුල් ගෙදරක චාරිත්‍ර විධි සියල්ලම බුලත් මුල් වෙයි. මනාලයාගේ නෑදෑ පිරිස මෙපමණ යයි දැන්වීම සඳහා එම පිරිසේ ප්‍රමාණයට බුලත්කොළ ගණනක් මනාලියගේ නිවසට පිරිනැමිය යුතු වේ. මනාලයා ඇතුළු පිරිසට මනාලියගේ වැඩිහිටි අය ඇතැම්විට බුලත් ඉලත්තට්ටුව තහංචි කෙරේ. විනෝදාංශයක් හැටියට එතැනදී මේ ජනතාව ගයමින් අභියෝගයක් එල්ලවේ.

"පළමුව මේ කප නසිනා කාලෙදි
බුලත් තිබුනෙ සකි කොහෙද කියත්
දෙවනුව මහසම්මත රජවලියට
බුලත් ගෙනාවේ කවුද කියන්
පත්තිනි පාලඟ කුමරුරු දුන්දා
බුලත් බෙදු අය කවුව කියන්
බුලත් උපත මට කියලා නොදී හෙම
ඉලත්තට්ටුව අතට නොතියන් "

එවිට මනාලයාගේ පිරිසේ වැඩිහිටියෙකු පිළිතුරුදී තහංචිය ඉවත් කරන්නේ මෙසේ කියමිනි.

"පළමුව මේ කප නසිනා කාලෙදි
බුලත් තිබුනෙ නා ලොව බව දානගන්
දෙවනුව මහසම්මත රජවලියට
බුලත් ගෙනාවේ නාග සෑදුන්
පත්තිනි පාලඟ කුමරුරු දුන්දා
බුලත් බෙදුවේ කඳ කුමරුන්
බුලත් උපත මම කියලා දුන්නට
ඉලත්තට්ටුව අතට දියන් "

මගුල් පෝරුවේ චාරිත්‍ර සඳහා අවශ්‍ය බුලත් පවා ගෙන එන්නේ මනාලයා විසිනි. පෝරුවේ චාරිත්‍ර ආරම්භ වන්නේ තෙරුවන් වෙනුවෙන් බුලත් අතක් වෙන්කොට තැබීමෙන් පසුවයි. පඬුරු සහිත බුලත් හත් අතක් නව යුවල අතින් මාරු කොට පෝරුව මත ට අත හැරීම තවත් සිරිතකි. පෝරුවෙන් බසීමට පෙර මනාලිය විසින් තම දෙමාපියන්ටත් වැඩිහිටි ඥාතීන්ටත් බුලත් හුරුළු පිළිගන්වා ආශිර්වාද ලබා ගනු ඇත. මනාලියගේ ඇවැස්ස මස්සිනා කෙනෙකු සිටිනම් ඔහුටද මනාලිය අතින් බුලත් අතක් පිරිනැමේ.

"මහ සම්මාන දෙවි සින් උනුකාලේ
මැණික්පාල දෙව් උන්හට ආලේ
ඒවා මගුල් සැරසුනි හට බාලේ
කඩුලු බුලත් ගනු කවුරුදැ රාලේ "

කඩුලු බුලත් අත හිමි මස්සිනා ගැහ විමසන අයුරුයි ඒ.

අවමගුල් අවස්ථාවලදීද නිවසට එන අයට බුලත්විට පිළිගැන්වේ. එතැනදී බුලත් වට්ටියේ බුලත් තැන්පත් කෙරෙන්නේ නොපිට හරවාය. අවමංගල ආගමික කටයුතු ඉටුකර දෙන ලෙස හික්ෂූන් වහන්සේලාට ආරාධනා කෙරන්නේ දැහැත් වට්ටියක් පිළිගන්වමිනි. බණට දහට පමණක් නොව වස් වසන්නට පවා හික්ෂූන් වහන්සේට ආරාධනා කෙරෙන්නේ දැහැත් වට්ටිය වෙනුවට දැහැත් ගොටුවක් පිළිගැන්වේ. වැඩිහිටියන්ට බුල්ත් අතක් දී වැඳීම අවුරුදු සිරිතකි. අකුරු කියාදෙන ගුරුතුමාට උපහාර පිළිදෙන්නේ බුලත් දී වැඳීමෙනි. වෛද්‍යවරයාට ගුරු පඬුරු පිළිදෙන්නේ ද බුලත් අත මත තබාය. මේ අනුව බුලත් අත සමස්ත සමාජයේ සමාජගත සම්බන්ධතා ආරක්ෂා කිරීමේත් ජීය යුත්තාට ගෞරව ප්‍රණාමය පුද කිරීමේදීත් සංකේතයක් බවට පත් වී ඇත.

ඉපැරණි අවධියේ සිටම බුලත සිංහල සංස්කෘතියට බැඳී පැවති බව සෙල්ලිපි වලින් පවා හෙළිවේ. දසවැනි සියවසට අයත් වඳලු සෙල්ලිපියේ මෙසේ සඳහන් වේ. "හොපිටිගමු පදියේ (මෙය මහියංගනයට නුදුරු වෙළඳ නගරයකි.) බුලත් පුවක් මැස්සක් මත තබා විකිණිය යුතු විය.

"බුලත් පුවක් මඩපයෙහිලා
විකුණනු කොට ඉසා"

එසේම පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රජුගේ ප්‍රීතිදායක මණ්ඩප ලිපියේ

"පස් පල වතින් යුත් බුලත් කා" යනුවෙන් සඳහන් වේ.

පිදුණු බුලත විට සඳහා විශේෂයි. ගිරිදාවල ඇත්තේ වෙනත් ගුණයකි. සිරුර සිරි තුවාල වූ විට අඟුරු කැටයක් ගිරිදා ඉස්මෙන් ගලගා ආලේප කරනු ලැබේ. බුලස් ඉස්ම "රාජතරංගනී" වැනි තෙල් සිඳීමේදී ද යොදාගනු ලැබේ.

පිරිත් මණ්ඩපයේ ඉහළින් වියන යට බුලත් පලුකන් එල්වනු ලැබේ. යන්තු, නූල් ආදිය ජප කිරීම සඳහා තනා ගන්නා මල් බුලත් තට්ටුවට බුලත් කොළ නවයක් තැන්පත් කෙරේ. දෙවියන්ට පඬුරු ඔප්පු කරන්නේද බුලත් මත තබාය. දෙවියන් සඳහා කෙරෙන මඩු උත්සව වලදී ද කොහොඹ යක් ගම්මාරියේදීද ඇදුරෝ බුලත්පදය නමින් විශේෂ නර්තන ප්‍රජාවක් ඉදිරිපත් කරයි.

සාහිත්‍ය ග්‍රන්ථයන්හි ද බුලත් සඳහන් වූ අවස්ථා බොහෝය.

"තනා පස් රස මියුරු
කුසුම් හැම ඇඟ තැවරු
දෙවා බුලතුත් කපුරු
තමා ඉස දෙපය දැරූ"

"ගණදෙවි හැල්ල"

බුලත් සැපීමෙන් තොලකට හැඩවූ අයුරු කාව්‍ය සේකරයේ මෙසේ සඳහන් වේ.

"කපුරු බුලතින් වත්
ලවනත වතල පැහැපත්
පියුම්රා මිණි වත්
දසන් අඟ මදහසින් සිත්ගත්"

රයිගමයා හා ගම්පලයා අතර ගෙතී ඇති ගමේ කථාවටද බුලත් සම්බන්ධ වී ඇත.

සාහිත්‍යයේදී පමණක් නොව වෙනත් කලාශිල්ප වලදීද අප සංස්කෘතිය හැඩ ගැස්වීමට බුලත් එක්වී ඇත. බුලත් විටට අවශ්‍ය දේ තබා ගැනීමට සිංහල ගොවියන් හා මහල්ලන් යොදා ගත්තේ බුලත් පයිය හෙවත් ඔලගුවයි. පැරණි බුලත් පසුම්බිය විසිතුරු ලෙස හැඩ වැඩ ගන්වා තිබුණු බව පෙනේ. මනාලයා මගුල් පෝරුවේදී මනාලියගේ පියාට බුලත් ඔලගුවක් හා රංගිරයක් පිළිගැන්වීමේ සිරිතක් විය. මහළු අය විට කොටා වළඳන බැවින් බුලත් වංගෙඩිය පැරනි ගෙවල් වල විය. සමහර බුලත් වංගෙඩි පිත්තලෙන්, රිදියෙන් හෝ වෙනත් ලෝහ වලින් තනා විසිතුරු ලෙස කැටයම් කොට තිබුණි. හුණු දමා තබාගන්නා කිල්ලොටයද පිත්තලෙන් හෝ රන් රිදී වැනි ලෝහ වලින් තනා කැටයම් කර තිබුණි. බුලත් පිළිගන්වන ඉලත්තට්ටුවද ලෝහයෙන් තනා කැටයම් කළ එකකි. ලී වලින් හෝ වැල් වලින් තැනුණු ඉලත්තට්ටුද විය. බුලත් සපා කෙළ ගැසීමට පඩික්කම අවශ්‍යම උපකරණයක් විය. ඒවාද ලෝහයෙන් තනා ගනු ලැබිණි. පුවක් කපන ගිරයද බුලත් සැපීමේ සිරිත නිසා තැනුණු අවියකි. පැරණි ගිරා කැටයම් කොට තිබුණි.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

මෙසේ විවිධ අංග වලින් සිංහල සංස්කෘතිය හැඩගැස්වීමේලා බුලත් කොළය අසුරෙන් විශාල මෙහෙවරක් ඉටුවී ඇති බව සඳහන් කළ හැකිය. බුලතත් සිංහලයාත් අතර ඇති බඳීම ඉදිරියටත් කාලයක් පවතිනු ඇත. එහෙත් බුලත් කෙළ ගසා මිදුල් බතික් කිරීමේ අවලස්සන පුරුද්ද අප අතරින් ඉවත් විය යුතුය'යි සිතමි.

MoneyGram®
Money Transfer

MoneyGram launches anti-fraud website

To help educate consumers and arm them with the knowledge to protect themselves, MoneyGram has launched a new anti-fraud website.

As many know MoneyGram provides a very valuable service in transferring money for emergencies and to support the financial needs of families. Unfortunately, there are scammers who use the network and services – and those of competitors – for fraudulent and illegal purposes. In fact, it might surprise you to learn that, in 2010, there were 4 billion phishing emails sent each day that attempted to extract money from unsuspecting consumers – and 700,000 U.S. consumers last year fell victim to money-related scams.

This is why, as part of their active leadership position in educating consumers about common scams and giving them the tools to protect themselves, MoneyGram have launched www.moneygram-preventfraud.com, a dedicated website that not only provides useful information but also details several common types of scams, such as sweepstakes and lottery scams, grandparent scams, check overpayment scams, mystery shopper scams and relationship scams.

Through this initiative, they are urging consumers –to use the downloadable tools and resources on this site and remember three simple rules we call "know, show and throw."

- **Know** – Always know the person to whom you are sending money. Never send money to strangers.
- **Show** – Never show or share information about your money transfer to anyone but the recipient.
- **Throw** – Discard or throw away any offers that promise easy ways to earn money, especially if the offers require you to *send* money before *earning* money.

Help MoneyGram get the word out about the new website by sharing it with your friends and loved ones, and add the address link to your list of "Favorites." They encourage you to periodically visit www.moneygram-preventfraud.com or www.moneygram.com, as updated content and new features will be continually added to help consumers learn how to avoid being a victim of fraud.

Don't become a victim. The more who know this information, the safer we'll all be.